<u>2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව</u>
<u>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව</u>
<u>වැය ශීර්ෂ අංකය 325</u>

<u>අන්තර්ගතය</u>


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණ (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 01.1 පොදු සමාලෝචනය

2009 දෙසැම්බර් මස 09 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ සම්මත 2009 අංක 41 දරණ වෙරළ ආරක්ෂක පනත මගින් මුහුදේදී ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම, ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම, සමුද්‍රීය දූෂණයෙන් සාගර සම්පත් සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම, සුරක්ෂිත සහ සාමකාමී සාගර කලාපයක් ඇති කිරීම යන දැක්ම සහ මෙහෙවර සහතික කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනයකි. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය තුල නීතිවිරෝධී ක්‍රියාකාරකම් වල නිරතව සිටින නෞකා, යාත්‍රා හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් පනත මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව බලය ලබාදී ඇත. 2010 මාර්තු මස 03 වන දින නිළ වශයෙන් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය තුළ සීඝ්‍ර ප්‍රගතියක් ලබා ඇත.

### 01.2 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර

අ. දැක්ම "සාමකාමී සමුද්‍රීය පරිසරයක් තුලින් ජාතික සුභ සිද්ධිය ආරක්ෂා කිරීම"

ආ. මෙහෙවර.

සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කිරීම සහ බලාත්මක සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීම, ජෛව විවිධත්ව කලමණාකරණය, ස්වභාවික හා මිනිසා විසින් නිර්මාණය කරනු ලබන ව්‍යවසනයන් කලමනාකරණය සහ ජීවිත හා දේපල ආරක්ෂක කිරීම වේ.

තවද, සමුද්‍ර පරිසරය සුරක්ෂිත කිරීම තුලින් පරිසරය සමතුලිතතාවය පවත්වා ගැනීම, සමුද්‍ර දූෂණය වැලැක්වීම සහ 'ඇ' සහ 'ඈ' ජේද යටතේ පහත ඉදිරිපත් කර ඇති කර්තව්‍යන් සහ කාර්යභාරයන්ද ඊට ඇතුලත් වේ.

### 01.3 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

අ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයෙන් පිටතදී සිදුවන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු වැළැක්වීම.

ආ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ සහ දේශිය ජල තීරය තුල සිදුකරන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්ධනය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ ආයතනයන් සහ සන්නද්ධ හමුදාවන් වෙත සහයෝගය ලබා දීම.

ඇ. ස්වභාවික ව්‍යවසනයන්හීදී විපතට පත්වූ පුද්ගලයන් සෙවීමේ හා ගලවාගැනීමේ රාජකාරී කටයුතු සඳහා දායකත්වය ලබාදීම.

ඈ. ශ්‍රී ලංකා වෙරළ තීරය තුල සිදුවන නීති විරෝධී/ අවිධිමත් සහ වාර්තාගත නොවන මසුන් ඇල්ලීමේ කටයුතු (IUU Fishing) වැලැක්වීම, මුහුදේදී ධීවරයන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම සහ ධීවරයින් ආරක්ෂා කිරීම.

ඉ. සමුද්‍රීය පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම සඳහා දායක වීම.

ඊ. සමුද්‍රීය දූෂණය හා ව්‍යසනයන් වැලැක්වීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මෙන්ම එම කටයුතු නියාමනය කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත සහයෝගය ලබාදීම.

උ. නීති විරෝධි භාණ්ඩ ජාවාරම් කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්යය බලකාය ඇතුළුව අනෙකුත් රාජ්‍ය ආයතනයන් වෙත සහයෝගය ලබා දීම.

ඌ. මුහුදේදී ජීවිත හා දේපළවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම.


එ. සමුද්‍රීය ජීවීන් විශේෂ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා දායක වීම.

ඒ. ස්වභාවික ව්‍යවසනයන්හීදී ගුවන්විදුලි හෝ වෙනත් ක්‍රමවේදයන් මගින් නිකුත් කරනු ලබන අනතුරු ඇඟවීමේ තත්වයන් පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීමට දායක වීම.

ඔ. රජය විසින් නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුව අනෙකුත් රාජකාරීන් සිදු කිරීම.

ඕ. මුහුදේදී සිදුවන ස්වභාවික ව්‍යවසනයන් සහ මුහුදු අනතුරුවලින් විපතට පත්වන ජීවිත හා දේපළ ගලවා ගැනීමේ කටයුතු සඳහා සහයෝගය ලබාදීම.


01.4 **සංවිධාන සටහන**




**01.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තුමේන්තු/ දෙපර්තුමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

භාර දී ඇති කාර්යයන් හා කාර්යයන් වල අනුකූලතාවය සහතික කිරීම මගින් ශ්‍රී ලංකා ශ්‍රී ලංකාවේ සමස්ත වෙරළ තීරය ආවරණය වන පරිදි සිය කඳවුරු, ස්ථාන, උප පොළවල්, ධීවර අධීක්ෂණ ස්ථාන (එෆ්එම්පී) සහ ජීවිතාරක්ෂක ස්ථාන (එල්එස්පී) සහ නාවික ඒකක යොදවා ඇත. තවද, ශ්‍රී ලංකා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සුමට ක්‍රියාකාරිත්වය සහ පහසු පරිපාලනය සඳහා, පහත දැක්වෙන පරිදි රටේ සමස්ත වෙරළ තීරය ආවරණය වන පරිදි වෙරළාරක්ෂක කලාප හතරක් ස්ථාපිත කර ඇත:

- ඒ. වෙරළාරක්ෂක උතුරු කලාපය.
- බී. වෙරළාරක්ෂක නැගෙනහිර කලාපය.
- ඇ. වෙරළාරක්ෂක දකුණු කලාපය.
- ඉ. වෙරළාරක්ෂක බටහිර කලාපය.



NORTHERN REGION
SLCG Headquarters
Regional Headquarters
SLCG Base
SLCG Station
Sub Station
Rear Headquarters
Life Saving Post (15)
Life Saving Duty Point (04)
Fishing Monitoring Point
Special Duty Point
KKS
PPD
Mailadi
Elara
Nilaweli
Cod Bay
Trincomalee
EASTERN REGION
Pasikuda
Valachchanei
Kalpitiya
Chilaw
Thoduwawa
Mahaoya Moya
WESTERN REGION
Negombo
Oluvill
Dilkovita
Crow Island
Galle Face
Aththidiya
Wellawatta
Mt. Lavinia
Dehiwala
Panadura
Egodauyana
Beruwala
Moragolla
Aluthgama
Bentota
Ahungalla
Balapitiya
Ambalangoda
Hikkaduwa
Polhena
Nilwella
Kirinda
Hambanthota
Tangalle
Kudawella
Unawatuna
Galle
Suduwella
Gandara
Dondara
Mirissa
SOUTHERN REGION

**01.6 අමාත්‍යාංශය/ දෙපර්තුමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතනය/ අරමුදල්**

නැත

**01.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)**

නැත

**<u>පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම</u>**

**02.1. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් 2020 වර්ෂය තුලදී සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව එහි සඳහන් ප්‍රමුඛ ක්‍රමෝපායන් වලට අදාලව පහත සඳහන් මෙහෙයුම්/ කාර්යයන් සිදුකරන ලදි .**

අ. ජිවිතාරක්ෂක රාජකාරින්

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් 2020 වසර තුල ජිවිතාරක්ෂක මුරකුටි 18 ක ජිවිතාරක්ෂක මෙහෙයුම් කටයුතු සිදුකරන අතර, 2020 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා මුහුදේ අනතුරට පත් ජීවිත 90 ක් බේරාගනු ලැබූ අතර, ඉන් 48 ක් විදේශිකයින් විය.

ආ. නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා සිදුකරනු ලැබූ වෙරළ ආරක්ෂණ මෙහෙයුම්

දිවයින වටා ඇති මුහුදු තීරයේ සිදුවන සියළුම නීති විරෝධි ක්‍රියාවන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති සියළුම යාත්‍රා යොදවනු ලබන අතර, ඉන් වේග ප්‍රහාරක මුර යාත්‍රා (FPB) 10 ක් සහ වෙරළබඩ මුර යාත්‍රා (IPC) දෙකක් උතුර විධානයට අනුයුක්තව මෙහෙයුම් කටයුතු සිදු කරයි. ඉතිරි මුර යාත්‍රා වයඹ, බටහිර සහ දකුණේ තෝරාගත් ප්‍රධාන/ ධීවර වරායන් වල රාජකාරින් හි යොදවා ඇති අතර, මිරිස්ස ප්‍රදේශයේ තල්මසුන් නැරඹීමේ කටයුතු සිදුකරන යාත්‍රා නිරීක්ෂණයට ද වෙරල ආරක්ෂක යාත්‍රා යොදවනු ලබයි.

ඇ. නීති විරෝධී, අක්‍රමවත්, වාර්තා නොවන මසුන් මැරීම් නිරීක්ෂණය

දිවයින වටා ධීවර වරායන් ආවරණය වන පරිදි ධිවර නිරීක්ෂණ මධ්‍යස්ථාන 24 ක් පිහිටුවා ඇති අතර, මෙම ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථාන මගින් මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා බහු දින ධිවර යාත්‍රා පිටවයාමේදි සහ නැවත වරායට ඇතුළුවිමේදි එම යාත්‍රාවන් පරික්ෂාවට ලක් කරනු ලැබේ. එහිදි එම යාත්‍රා පිටත්විමේදි යම් කිසි නිති විරෝධි ධීවර උපාංග තිබේද යන්න පරික්ෂා කරන අතර. නැවත වරායට පැමිණිමේදි ඔවුන් විසින් නීති විරෝධී මත්සයින් හෝ වෙනත් ද්‍රව්‍ය රැගෙන ඒ දැයි පරික්ෂා කිරිම සිදුකරයි.

ඈ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්

වෙරළ තීරයේ ජීවත්වන ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා මුහුදේදී ජීවිත ආරක්ෂාව, සමුද්‍ර දූෂණය වැලැක්වීම සහ සමුද්‍රිය පරිසර ආරක්ෂණය, වෙරළ ආරක්ෂණය, ජීවිත බේරාගැනීම් සම්බන්ධව, වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්, නීති විරෝධීව මසුන් මැරීම වැලැක්වීම සඳහා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සහ වෙරළ ආරක්ෂිත ශාඛ සිටුවීම යන වැඩසටහන් යටතේ ක්‍රමානුකුලව සිදුකරනු ලබයි.

ඉ. සෝදිසි සහ බේරා ගැනීමේ මෙහෙයුම්

මෙම ආයතනය සතුව ඇති සම්පත් උපයෝගී කර ගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන සෝදිසි කිරීම් සහ බේරාගැනීම් කටයුතු වලට සහය ලබා දීම සිදු කරන අතර තවද, පොලීසිය විසින් සහය ඉල්ලා සිටි අවස්ථාවන්හිදි ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමද සිදු කරයි.

ඊ. මුහුදු නීතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්

ශ්‍රී ලංකා මුහුදු තීරය තුල සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් සිදු කරනු ලැබූ අතර, අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ සංවිධාන සහ රාජ්‍ය ආයතනවලට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, නාවික හමුදාව සහ ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග එක්ව ඉන්දියානු ධීවරයින් පෙරලා සිය රටට යැවීම සහ ශ්‍රී ලාංකික ධිවරයින් නැවත සිය රටට ගෙන්වා ගැනිමේ මෙහෙයුම් සිදු කරනු ලැබේ. 2020 වර්ෂය තුල ශ්‍රී ලංකා ධීවර යාත්‍රා 10 නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සිදුකරන ලදී.

උ. සමුද්‍රීය පරිසර ආරක්ෂණය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් තෙල් කාන්දුවීම් අනතුරු සඳහා ප්‍රතිචාර දැක්වීම සිදු කරන අතර, ඒ සඳහා විශේෂිත පුහුණු කණ්ඩායම්, 24 පැය පුරාවට සූදානම්ව තබා ඇත. එම කණ්ඩායම විසින් මේ වන විටත් තෙල් විසිරුම් පාලන මෙහෙයුම් ගණනාවක් සිදු කර ඇති අතර, 2020 වර්ෂයේදී ත්‍රිකුණාමලය සැන්ඩ් බේ හි යාත්‍රාවක තෙල් විසිරුම පාලනය, දෙවුන්දර ධීවර වරායේ ධීවර යාත්‍රාවක් පෙරලීමේ ඇති වූ තෙල් විසිරීම පාලනය කරීම, නිල්වැල්ල ධීවර වරායේ ධීවර යාත්‍රාවක් පෙරලීමේ ඇති වූ තෙල් විසිරීම හා MT NEW DIAMOND නෞකාවේ ආපදාව අවස්ථාවේදී වෙරළ ආරක්ෂක නෞකා 02 ක් හා තෙල් විසිරීම් පාලන කණ්ඩායම් අනුයුක්ත කිරීම වැනි මෙහෙයුම් සිදු කරන ලදී. තවදුරටත් කැස්බෑ බිත්තර සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කැස්බෑ පැටවුන් ආරක්ෂා සහිතව මුහුදට මුදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන අතර, ඒ අනුව මෙම කාලසීමාව තුල කැස්බෑ පැටවුන් 10197 ක ප්‍රමාණයක් මුහුදට මුදාහැර ඇත. තවද, පරිසර හිතකාමී වැඩසටහන් යටතේ වෙරළ ආරක්ෂක කඳවුරු ආශ්‍රිත මුහුදු තීරයන් වල කඩොලාන ශාක වගාකිරීමේ කටයුතු ද අඛණ්ඩව සිදුකරනු ලබයි.

ඌ. අන්තර්ජාතික සහ කලාපීය සහයෝගීතා වර්ධනය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, අන්තර්ජාතික සහ කලාපීය සහයොගීත්වය වර්ධනයෙහි ලා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය (UNODC), ReCAAP, බාලි ක්‍රියාවලිය, ආසියානු වෙරළ ආරක්ෂක නියෝජිතයින්ගේ සහ ප්‍රධානීන්ගේ සමුලුවේ අන්තර්ජාතික සහ කලාපීය ආයතන සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරන අතර, 2020 සැප්තැම්බර් මස 17 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවති ජපන් - ශ්‍රී ලංකා කතිකාව සඳහා වෙරළ ආරක්ෂක නිලධාරීන්ද සහභාගීවිය. තවද, ත්‍රිපාර්ශවීය වෙරළ ආරක්ෂක අභ්‍යාසය (DOSTI) 2021 ජනවාරි මස හෝ පෙබරවාරි මස ආරම්භ වීමටද යෝජිත අතර, ඒ සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක නෞකා ද සහභාගී වීමට නියමිතය.

## 02.2. ගැටළු, අභියෝග සහ මධ්‍ය කාලීන සැලසුම්

අ. ශ්‍රී ලංකාව ආසන්න වශයෙන් කිලෝමීටර 1600 ක් දිගු වෙරළ තීරයක් සහ වර්ග කිලෝමීටර් 21500 ක භෞමික මුහුදු ප්‍රදේශයකින් සමන්විත වේ. එහි මුහුදු නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී මුර සංචාරයක් අවශ්‍ය වන අතර එමගින් මෙම මුහුදු ප්‍රදේශයේ සුරක්ෂිතභාවය සහතික කරයි. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) සමඟ ඇති කර ගත් ගිවිසුම්වලට අනුව, ශ්‍රී ලංකාවට වෙන් කර ඇති සෙවුම් සහ මුදාගැනීමේ (SAR) කලාපය විශාල මුහුදු ප්‍රදේශයකින් සමන්විත වන අතර, එය භූමි ප්‍රමාණය මෙන් විසි හත් ගුණයකින් විශාලය. ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවසිය සමුද්‍රීය අභියෝගයන් වන දේශ සීමා ආරක්ෂාව, මත්ද්‍රව්‍ය ජාවාරම, සමුද්‍රීය මුහුදු කොල්ලකෑම් සහ මුහුදේ නීතිවිරෝධී ක්‍රියා, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ (IUU) මසුන් ඇල්ලීම, නීති විරෝධී සංක්‍රමණ සහ සමුද්‍රීය පරිසර දූෂණය වැනි කටයුතු සාර්ථකව මැඩ පවත්වනු ලැබේ.

ආ. මෙහෙයුම්

වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවතින නෞකා සහ යාත්‍රා ප්‍රමාණවත් නොවේ. විශාල සෝදිසි සහ බේරාගැනීමේ කලාපයක් සහිත මුහුදු ප්‍රදේශය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව සතුව පවතින වගකීම අතිමහත්ය. එබැවින්, ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් හැකියාවන් සහ ධාරිතාව වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා, ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක ආයතන, ස්ථාන, උප ස්ථාන, ජීවිතාරක්ෂක මුරකුටි පිහිටුවීම / වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මධ්‍ය කාලීනව ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා පහත සඳහන් අත්පත් කර ගැනීමේ / මිලදී ගැනීමේ සැලැසුම් ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.

| SR NO | FLEET UNIT/ ESTABLISHMENTS | EXISTING UNITS | 2022-2025 | TOTAL |
|---|---|---|---|---|
| 01 | Off-shore Patrol Vessel (OPV) | 01 | OPV-01 | 02 |
| 02 | Ocean Going Pollution Control Vessel (PCV) | - | PCV-01 | 01 |
| 03 | Fast Patrol Boat (FPB) | 10 | FPB-01 | 11 |
| 04 | Inshore Patrol Craft (IPC) | 10 | IPC-02 | 12 |
| 05 | SLCG Bases | 02 | SLCG Kirinda<br>SLCG Chilaw<br>SLCG Mahaweli | 05 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | SLCG Station (CGS) | 02 | CGS Nilaweli | 03 |
| 07 | SLCG Substation (SS) | 24 | CGSS Mutuwal<br>CGSS Negambo | 26 |
| 08 | Life Saving Post (LSP) | 18 | LSP Negambo<br>LSP Preethipura<br>LSP Calido-beach | 21 |

ඇ. NOSCOP (ජාතික තෙල් කාන්දුවීමේ හදිසි සැලැස්ම) අනුව තෙල් කාන්දුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ පළමු ආයතනය වනුයේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවයි. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සාගරයේ පළමු පෙළ තත්වයට පවා මුහුණ දීමට පූර්ව සූදානමකින් සිටී. එබැවින්, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය මූලික උපකරණ ලබා ගැනීමට සැලසුම් කර ඇත.

ඇ. පුහුණු කටයුතු

වෘත්තීයමය වශයෙන් රාජකාරි ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහ නාවිකයන්ගේ පුහුණුව අනිවාර්ය වේ. පහත දක්වා ඇත්තේ එම පුහුණු වර්ධන වැඩසටහන්ය.

අ. සිවිල් පුද්ගලයින් සඳහා අතරමැදි හා ලෝකඩ පදක්කම් ජීවිතාරක්ෂක පුහුණු පාඨමාලා හඳුන්වාදීම.

ආ. ශ්‍රීලංවෙආ දෙපාර්තමේන්තුව සඳහා ජංගම ජීවිතාරක්ෂක පුහුණු කණ්ඩායමක් පිහිටුවීම.

ඇ. විදේශ රටවල් සමඟ සහයෝගීතාවයෙන් වැඩි දේශීය පුහුණු අවස්ථා ලබාදීම.

ඉ. තාක්ෂණික

බල බෙදාහැරීමේ පද්ධති වැඩි දියුණු කිරීම, දුරකථන හා දත්ත ජාලය වැඩිදියුණු කිරීම සහ නව රේඩාර් සහ විද්‍යුත් දෘෂ්‍ය උපාංග සමඟ සමුද්‍රීය සුපරීක්ෂණය වැඩි දියුණු කිරීම මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ධාරිතාවය වැඩි කිරීමට ද සැලසුම් කර ඇත.

GEWMAN EKANAYAKE, RSP & Bar, USP, Psc
Rear Admiral
Director General - SLCG

..............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

<u>**පරිච්ඡේදය 03 – 2020 සෙංැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**</u>

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**ඒසීඒ-එෆ්**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2020 | | සටහන | සත්‍ය 2020 | සත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 144,670,000.00 | 323,170,000.00 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 74,592.60 | 2,721,176.00 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | - | - | **ඒසීඒ-5** |
| - | වෙනත් ලැබීම් | | 481,487.53 | 3,613,274.00 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **145,226,080.13** | **329,504,550.00** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **145,226,080.13** | **329,504,550.00** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 247,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | **211,339.06** | 131,134.00 | |
| 49,665,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | **48,869,840.82** | 70,985,826.00 | ඒසීඒ-2(ii) |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | - | - | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 49,912,000.00 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **49,081,179.88** | 71,116,960.00 | |
| | **මූලධන වියදම්** | | | | |
| 140,587,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 126,516,811.07 | 212,741,579.00 | |
| 23,071,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 18,507,612.22 | 42,082,709.00 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 10,176,000.00 | හැකියා වර්ධනය | 14 | 7,069,211.03 | 16,555,378.00 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| 173,834,000.00 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **152,093,634.32** | 271,379,666.00 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | - | - | |
| | **තැන්පතු ගෙවීම්** | | 305,150.00 | 2,710,201.00 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | - | - | **ඒසීඒ-5** |

| | | | |
|---|---|---|---|
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | 201,479,964.20 | 345,206,827.00 |
| 223,746,000.00 | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ- උ)** | (56,253,884.07) | (15,702,277.00) |

**3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

**ඒසීඒ-පී**

**2020 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සත්‍ය 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,067,996,003.26 | 103,427,526.00 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | - | - |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **2,067,996,003.26** | **103,427,526.00** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම් | | - | - |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,067,926,885.06 | 103,427,526.00 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 69,118.20 | 299,675.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **2,067,996,003.26** | **103,727,201** |

පිටු අංක..........සිට ......... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .......... සිට .......... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ..................................... | ..................................... | ..................................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : | දිනය : | දිනය : |
| General Kamal Gunaratne (Retd) WWV RWP RSP USP ndc psc MPhil Secretary Ministry of Defence, | GEWMAN EKANAYAKE, RSP & Bar, USP, Psc Rear Admiral Director General - SLCG | පීසීපී ප්‍රනාන්දු ගණකාධිකාරි ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව |

**03.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

**ඒසීඒ-සී**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සත්‍ය | |
|---|---|---|
| | 2020<br>රු. | 2019<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 481,487.53 | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 144,670,000.00 | 329,504,550 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 145,151,487.53 | **329,504,550** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 48,474,157.88 | 131,134 |
| සහනාධාර සහ මාරුකිරීම් | - | 70,985,826 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 538,157 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | 48,474,157.88 | **71,116,960** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **96,677,329.65** | **258,387,590** |

| | | |
|---|---|---|
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 96,446,772.25 | 258,387,590 |
| අත්තිකාරම් ගෙවීම් | - | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 96,446,772.25 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | (96,446,772.25) | **258,387,590** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **230,557.40** | |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 74,592.60 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **74,592.60** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 305,150.00 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **305,150.00** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(230,557.40)** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

**03.4 මූල්‍ය ප්‍රකාශ සටහන්**

**03.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

රු.000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස |
| නැත | නැත | නැත | නැත | නැත | නැත |

**03.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තථ්‍ය වියදම් | උපයෝගී කරනුලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුණරාවර්තන | 47,412 | 49,912 | 49,081 | 98.33 |
| ප්‍රාග්ධන | 173,834 | 173,834 | 152,093 | 87.49 |

**03.7 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු.000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| නැත | නැත | නැත | නැත | නැත | නැත | නැත |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 272,689 | 281,631 | - | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 120,721 | 129,956 | - | 100 |
| 9153 | ඉඩම් | 1,640,028 | 1,640,028 | - | 100 |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 16,110 | 16,110 | - | 100 |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

03.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**<u>පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක</u>**

### 04.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම් | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| වැටුප් හා වේතන - 1001<br>1) වැ/බ ගණකාධිකාරීගේ වැටුප් ගෙවීම.<br>2) දෙපාර්තමේන්තු මිලදී ගැනීමේ කමිටු සාමාජිකයින් වෙත ගෙවීම් කිරීම. | | √<br>85.56% | |
| දේශීය ගමන් වියදම් - 1101<br>රාජකාරී ගමන් සඳහා අධිවේගී මාර්ගය භාවිත කිරීම වෙනුවෙන් වියදම් පියවීම. | √<br>99.42% | | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ - 1201<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලිපි ද්‍රව්‍ය අවශ්‍යතාවය මිළදී ගැනීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම සඳහා සමුපූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.98% | | |
| ඉන්ධන - 1202<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහන සඳහා නාවික හමුදාව වෙතින් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.99% | | |
| ආහාර හා නිළ ඇඳුම් - 1203<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත පුද්ගලයින්ට නිළ ඇඳුම් ලබා දීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>100.00% | | |
| වෙනත් - 1205<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන පොදු ගබඩා විෂයයන් මිළදී ගැනීම වෙනුවෙන් වන බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>100.00% | | |
| වාහන නඩත්තු වියදම් - 1301<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහන වල සුළු අළුත්වැඩියාවන් සහ සේවාවන් කිරීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම් කිරීම සඳහා සමුපූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.99% | | |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ නඩත්තු - 1302<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් විදුලිජනක යන්ත්‍ර, පිටත දහන යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍ර වල අළුත්වැඩියාවන් සහ සේවාවන් සිදු කිරීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම් කිරීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.99% | | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් - 1303<br>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි සහ ඉදිකිරීම් වල නඩත්තු සඳහා වන වියදම් සඳහා සම්පූර්ණ මුදල වෙන් කරන ලදී. | √<br>95.29% | | |

| | | | |
|---|---|---|---|
| ප්‍රවාහන කුලී - 1401<br>සුදුසු වාහන කුලී පදනම මත ලබා ගැනීම සහ ගලි බවුසර් සහ වතුර බවුසර් කුලී පදනම මත ලබා ගැනීම සම්බන්ධයෙන් වන බිල්පත් නිරවුල් කිරීම. | √<br>97.55% | | |
| තැපැල් ගාස්තු හා සන්නිවේදන– 1402<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දුරකථන සහ තැපැල් ගාස්තු සඳහා ගෙවීම් කිරීමට සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.83% | | |
| විදුලිය හා ජලය – 1403<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි විදුලි හා ජල බිල්පත් සඳහා<br>ගෙවීම් කිරීමට සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>97.49% | | |
| බදු කුලී – 1404<br>ශ්‍රිලංවෙආ වරුණ සහ ඔළුවිල් යන ආයතන පිහිටා ඇති ඉඩම් සඳහා රජයේ බදු ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.09% | | |
| වෙනත් – 1409<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අනෙකුත් පොදු සේවාවන් වෙනුවෙන් වූ වියදම් සඳහා සම්පූර්ණ මුදල වෙන් කරන ලදී. | √<br>99.97% | | |
| ගොඩනැගිලි හා සැකසුම් – 2001<br>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි පුනරුත්තාපනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වන වියදම් සඳහා සම්පූර්ණ මුදල වෙන් කරන ලදී | | √<br>89.87% | |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ – 2002<br>ශ්‍රිලංවෙආනෞ සුරක්ෂා නෞකාවේ සහ අනෙකුත් වෙරළ ආරක්ෂක නෞකා සහ යාත්‍රා වල පහත සඳහන් අළුත්වැඩියාවන්ට අදාල බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.<br>අ. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාවන්<br>ආ. වියලි නැව් තය්‍යාකංගනයට ගෙන සිදු කරනු ලබන අළුත්වැඩියාවන්. | √<br>91.82% | | |
| වාහන - 2003<br>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු වාහන වල ප්‍රධාන අළුත්වැඩියාවන් වන ටින්කරින් කිරීම, පින්තාරු කිරීම සහ අනෙකුත් ප්‍රධාන අළුත්වැඩියාවන් වෙනුවෙන් වන බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>99.29% | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ – 2102<br>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු රාජකාරීන් සිදු කිරීම සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිළදී ගැනීම සඳහා වන වියදම් පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | | | √<br>64.04% |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ – 2103<br>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි නෞකා, යාත්‍රා සහ ආයතන වලට අවශ්‍ය යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම සඳහා වන බිල්පත් පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | √<br>98.77% | | |
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් – 2104<br>ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ගොඩනැගිලි | √<br>95.83% | | |

| | | | |
|---|---|---|---|
| අළුත්වැඩියා කිරීම / ඉදි කිරීම සඳහා වන වියදම් පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.<br>1) වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම් කිරින්දහි ජ්‍යෙෂ්ඨ නිලධාරි නිවසනයේ නානකාමරය, කණිෂ්ඨ නාවිකයින්ගේ නිවස්නය, අවි ගබඩාව සහ අපජලය කළමනාකරණ පද්ධතිය.<br>2) ශ්‍රීලංවෙආ රෝහණ කාර්යවර්ධන ශාලාව.<br>3) ශ්‍රීලංවෙආ වරුණ නිලධාරි නිවාසයේ අමතර කාමර දෙකක් ඉදිකිරීම.<br>4) වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම් හලාවතහි ආරක්ෂක වැට අළුත්වැඩියාව.<br>5) වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම් දෙහිවල රේඩාර් මධ්‍යස්ථානය නවීකරණය කිරීම. | | | |
| පුහුණු කිරීම් හා හැකියාවන් වර්ධනය කිරීම – 2401<br>වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පුද්ගලයින්ගේ දැනුම සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන් ලබා ගැනීම සඳහාත්, දෙපාර්තමේන්තුවේ පුහුණු පහසුකම් වර්ධනය කිරීම සඳහාත් වන වියදම පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. | | | √<br>69.47% |

## පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 05.1. තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්ක/ අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයගුණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| ක්‍රියාත්මක කර නැත | - | - | - | - | - |

### 05.2. තිරසාර සංවර්ධන ව්‍යාපෘති දැනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක නොවන බැවින් ඉලක්ක සපුරා ගැනීම හෝ අභියෝග පිළිබඳ තොරතුරු නොමැත.

## පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

| අඅ. | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම. |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | නීති විරෝධී අවිධිමත් ධීවර මත්ස්‍ය කර්මාන්තය සම්බන්ධයෙන් සම්බන්ධයෙන් පැවති සමුළුව (BOBP) | 2 | 01.09.2019<br>20.09.209 | | 295,628.00 | ඉන්දියාව | වෙරළකආරක්‍ෂ රාජකාරි දැනුම. |
| 2 | සමුද්‍රීය සුරක්ෂිත භාවය සහ ආරක්ෂණ කිරීමේ ආයතනයන් ශක්තිමත් කිරීම පුහුණු වැඩසටහන | 4 | 20.08.2019<br>22.08.2019 | | 1,718,829.00 | ඇමෙරිකාව | කලාපීය සහයෝගීතා වර්ධනය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | නීති විරෝධී මුහුදු සංක්‍රමන පිලිබඳ අභ්‍යාසය | 4 | 18.02.2019.<br>15.03.2019<br>19.08.2019<br>13.09.2019 | | 405,282.00 | ස්විඩනය | වෙරළක ආරක්ෂ රාජකාරි දැනුම. |
| 4 | ආරක්ෂක සහ පාරිසරික පරිපාලන සම්බන්ධ විශේෂඥතා පශ්චාත් වැඩසටහන | 3 | 21.04.2019<br>12.04.2019 | | 642,953.88 | ස්විඩනය | වෙරළක ආරක්ෂ රාජකාරි දැනුම. |
| 5 | ව්‍යසන නිවාරණය හා පරිසර ආරක්ෂාව සම්බන්ධ පාඨමාලාව | 1 | 18.06.2019<br>20.06.2019 | | 36,267.60 | ජපානය | වෙරළක ආරක්ෂ රාජකාරි දැනුම. |
| 6 | නවවන ජාතික ගලවා ගැනීමේ සහ මුදවා ගැනීමේ අභ්‍යාස (SAREX – 20) - ගෝවා, ඉන්දියාව | 1 | 01.07.2019<br>05.07.2019 | | 189,970.70 | මාලදිවයින | වෙරළක ආරක්ෂ රාජකාරි දැනුම. |
| 7 | පුළුල් සමුද්‍රිය සහයොගිතා ආරක්ෂණ පාඨමාලාව | 1 | 01.08.2019<br>28.08.2019 | | 215,146.00 | ඉන්දියාව | වෙරළක ආරක්ෂ රාජකාරි දැනුම. |

**06.1. සේවක සංඛ්‍යා කළමණාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| නිලධාරීන් | 125 | 106 | 19 |
| නාවිකයින් | 1500 | 1301 | 199 |

**06.2. වර්ථමානයේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුද්ගල අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරාලනු ලබන්නේ ශ්‍රී ලංකා නාවික හමුදාව විසිනි. මෙහිදී ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු මෙහෙයුම් රාජකාරි ඉටු කිරීම සඳහා ඉහත සඳහන් පරිදි අනුමත සේවක සංඛ්‍යාවක් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ලබා ගැනීමට අනුමත කර ඇති අතර ඉන් ඉහත පරිදි සේවක හිඟයක් සහිතව ලබාදී ඇති සේවක සංඛ්‍යාව මගින් දැනට දුෂ්කරතාවයන් මද්දේ වෙරළ ආරක්ෂක රාජකාරි ඉටුකරනු ලබයි.**

**06.3. මානව සම්පත් සංවර්ධනය**

| **වැඩසටහනේ නම** | **පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව** | **වැඩසටහනේ කාල සීමාව** | **සමස්ථ ආයෝජන (රු.000)** | | **වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)** | **නිමැවුම/ ලබාගත් දැනුම** |
|---|---|---|---|---|---|---|
| | | | **දේශීය** | **විදේශීය** | | |
| නෞකා වලට ගොඩවීමේ පාඨමාලා | 04 | දින 14 යි | - | - | දේශීය | මුහුදේදී නෞකාවලට ගොඩවී අදාල රාජකාරි කිරීමේ හැකියාව |
| ජීවිතාරක්ෂක පාඨමාලා | 61 | දින 05 යි | - | - | දේශීය | ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව |
| තෙල් විසිරීම වැළැක්වීමේ පාඨමාලාව | 77 | දින 10 යි | - | - | දේශීය | තෙල් විසිරීමක් සිදුවූ විටදී එය තවදුරටත් විසිරීම වළක්වා තෙල් ඉවත් කිරීමේ හැකියාව |

**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව**

| අනු. අං. | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා පැහැදිලි කිරීම | අනුකූළ නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නාවික හමුදාව වෙතින් ද්විතික පදනම මත කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වානිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | වෙආදෙ විිසින් ව්‍යාපාර හා නිෂ්පාදන කටයුතු සිදු කරනු නොලබයි | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | වෙආදෙ තුල එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලබයි | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | වෙආදෙ තුල එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලබයි | |
| 1.6 | වෙනත් | නැත | | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලින කර පවත්වාගෙන යාම | අදාල නොවේ | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නාවික හමුදාව වෙතින් ද්විතික පදනම මත කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් ඔවුන්ගේ පඩි නඩි නාවික හමුදාව වෙතින්ම ගෙවනු ලබයි | |
| 2.3 | විගණනවිමසුම් ලේඛනයයාවත් කාලින කර පවත්වාගෙන යාම. | අනුකූලවේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යහවත් කාලින කර පවත්වාගෙන යාම. | අනුකූලවේ. | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CLGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැර කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135) | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/ 2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිවයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අදාල නොවේ | ද්විතික පදනම මත නාවික හමුදාව වෙතින් කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් වැටුප් සැකසීමක් සිදුනොවේ. | |
| 4 | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාන්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | විගණන විමසුම් | | | |
| 5.1 | විගණනකාධිපතිවරය විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබිම. | අනුකූල වේ. | | |
| 6 | අභ්‍යන්තර විගණනය | | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.1 | මු.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණනකාධිපතිවරයා සමගසාකච්චා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | . | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්ථාවකටම මාසයක කාලයක් තුල දී පිලිතුරු සපයාතිබීම. | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරවසියලුම අභ්‍යන්තර විගණන වාර්ථාවල පිටපත් කළමනාකරණ විගණන දේපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම. | අනුකූල වේ. | | |
| 8 | වත්කම් කළමණාකරනය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛණයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීමේ හා අපහරණය කිරීම පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වර්ථා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ථා නියමිත දිනට විගණකාධිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | චක්‍රලේඛය අනුව 2021 ජුනි මස 15 වන දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල නොවේ | චක්‍රලේඛය අනුව 2021 අප්‍රේල් මස 15 වන දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්ථා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව,බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමණාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා සැලසුම් කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රථිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම් වලට එලඹීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | ද්විතීක පදනම මත නාවික හමුදාව වෙතින් කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් වෙආදෙ වෙතින් ණය ලබා දීමක් සිදුනොකරයි. | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අදාල නොවේ | | |
| 12.2 | හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අදාල නොවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කිරීම | අදාල නොවේ | | |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල්පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසදුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | ආදායම් ගිණුම් | මෙම දෙපාර්තමේන්තුව ආදායම් උපයන ආයතනයක් නොවන බැවින් අදායම් ගිණුම් පවත්වාගෙන යාමක් සිදු නොකෙරේ. | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස්කර තිබු ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම. | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | මානව සම්පත් කළමනාකරනය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූලවේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබාදීම | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | 2020 වර්ෂයට අදාලව තොරතුරු ඉල්ලීම් නොමැත | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යංශය චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | මෙතෙක් සම්පාදනය කර නොමැත | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මෙතෙක් සම්පාදනය කර නොමැත | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මෙතෙක් සම්පාදනය කර නොමැත | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | වාර්ෂික කාර්ය සාධක ගිවිසුම අත්සන් කොට නොමැත | අත්සන් කිරීමට නියමිතය |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡෙදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූලවේ | | |
| 20 | විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මගින්පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබිම. | අනුකූලවේ. | | |